160

පූර්ණ

# ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශයේ ගෘහස්ථ බලශක්ති පරිභෝජනය

ඩී. ඇම්. අජිත් දිසානායක

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති (ආර්ථිකවිද්‍යා)
උපාධි පරීක්ෂණයේ පාර්ශවිය අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම
සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ නිබන්ධිකාව

ලියාපදිංචි අංකය : A 16736

විභාග අංකය : S. P. A. 415

ප්‍රවේශ අංකය 160
වර්ග අංකය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

1997 - මාර්තු

# පෙරවදන

ශ්‍රී ලංකාව නව කාර්මික රටක් වීම සඳහා මේ වන විටත් ආර්ථික ප්‍රතිපත්ති මෙහෙයවමින් සිටී. කාර්මිකකරණයේ පූර්ව අවශ්‍යතාවක් ලෙස අඛණ්ඩ බලශක්ති සැපයුමක් පැවතිය යුතුය. වර්තමානයේ බලශක්ති සැපයුම ඉක්මවා යන බලශක්ති ඉල්ලුමක් දක්නට ලැබේ. එනම්, බලශක්ති පරිභෝජනය ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය වීමකි. එබැවින්, නුදුරු අනාගතයේ දී බලශක්ති අර්බුදයක් ඇති වීම නොවැලැක්විය හැක්කක් බවට බලශක්ති විද්‍යාඥයන් විසින් අනතුරු අඟවා ඇත.

ශ්‍රී ලංකාව වර්තමානය දක්වාම පරිභෝජනය කරන ලද බලශක්තියෙන් වැඩි ප්‍රතිශතයක් වාණිජමය නොවන ගණයට අයත් වේ. එහෙත්, කාර්මික ක්ෂේත්‍රය සඳහා වාණිජමය නොවන බලශක්ති ප්‍රභවයන්ගෙන් ඉටුවන කාර්යභාරය සීමිත වේ. එබැවින්, කාර්මිකකරණ ක්‍රියාවලිය සඳහා වඩාත් අත්‍යවශ්‍ය වන්නේ වාණිජමය බලශක්ති සැපයුමේ වර්ධනයකි.

ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් 70% ක් පමණ වාසය කරණුයේ ග්‍රාමීය අංශයේය. නාගරික අංශයට සාපේක්ෂව ග්‍රාමීය අංශයේ අඩු සංවර්ධන මට්ටමක් දක්නට ලැබේ. සංවර්ධන ක්‍රියාවලිය කඩිනම් කර ගැනීම සඳහා ග්‍රාමීය අංශයට ප්‍රමුඛත්වය ලබා දිය යුතුව ඇත. ග්‍රාමීය අංශයේ වාණිජමය බලශක්ති පරිභෝජනය නාගරික අංශය හා සසඳා බලන කළ අඩු මට්ටමක පවතී. මෙම ස්වාභාවය එම අංශයේ අඩු සංවර්ධන මට්ටමක් පැවතීමට එක් හේතුවක් බව ආර්ථික ක්‍රමසම්පාදකයන් විසින් පෙන්වා දී ඇත. එමෙන්ම විවිධ බලශක්ති ප්‍රභවයන්, විවිධාකාරයට, අසංවිධිතව පරිභෝජනය කිරීමක් ග්‍රාමීය අංශයේ දක්නට ලැබේ. එහෙයින්, සංවර්ධනය සඳහා ආර්ථික ප්‍රතිපත්ති සකස් කිරීමේදීත්, ක්‍රමසම්පාදනයේදීත්, බලශක්ති අර්බුදය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුව තිබේ. එවැනි වැඩ පිළිවෙලක් සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවක් වශයෙන් ග්‍රාමීය අංශයේ ගෘහස්ථ බලශක්ති පරිභෝජනය කෙරෙහි බලපාන සාධක හඳුනා ගත යුතු වේ.

මෙම අධ්‍යයනයේ අරමුණු යොමු කර ඇත්තේ ශ්‍රී ලංකාවේ බලශක්ති වෙළෙඳ පොළේ අසමතුලිතතාවන් හා අපේක්ෂිත බලශක්ති අර්බුදයට විසඳුම් සෙවීමේ දී ග්‍රාමීය අංශයේ බලශක්ති පරිභෝජන ස්වාභාවය අධ්‍යයනය කිරීම් වෙතය. ඒ යටතේ මූලික තේමාව ග්‍රාමීය අංශයේ ගෘහස්ථ බලශක්ති පරිභෝජනය කෙරෙහි බලපාන සාධක මොනවා ද යන්න න්‍යායාත්මකව හා විෂයානුබද්ධව හඳුනාගෙන, එමඟින් බලශක්ති පරිභෝජන ශ්‍රිතයක් ගොඩ නැඟීමය. එහි දී හඳුනාගන්නා ලද විචල්‍ය හා බලශක්ති පරිභෝජන වියදම් අතර පවත්නා සහ-සම්බන්ධතාව පරීක්ෂා කිරීමක් කර ඇත. එමෙන් ම, මෙම අධ්‍යයනය බලශක්ති අර්බුදයට විසඳුම් උදෙසා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සකස් කරන්නන්ට පූර්ව අවශ්‍යතාවක් සපුරාලීමේ උත්සාහයක් වනු ඇත.

ඩී. ඇම්. අජිත් දිසානායක
ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය,
කැලණිය විශ්ව විද්‍යාලය,
ශ්‍රී ලංකාව.
1997.03.31